# 7. ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

## 7.1 ජනගහනය

1998 වර්ෂයේ මැදි වසර ජනගහනය දශ ලක්ෂ 18.8 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. ඒ අනුව 1997 දී සියයට 1.3 ක් වූ මැදි වසර ජනගහන වර්ධනය 1998 දී සියයට 1.2 දක්වා අඩු වීමක් පෙන්වයි. මෙම අඩු වීමට හේතුව ජනගහනයේ ස්වභාවික වර්ධනය පහළ බැසීමයි. 1998 දී මැදි වසර ජනගහනයට තවත් පුද්ගලයින් 222,000 ක් එකතු විය. වර්ග කිලෝ මීටර් එකකට සිටින පුද්ගලයන් සංඛ්‍යාව ලෙස ඇස්තමේන්තු කරනු ලබන ජනගහන ඝණත්වය, 1997 දී 296 සිට 1998 දී 299 දක්වා ඉහළ නැගුණි. ජනවිකාශ දියුණුව සහ අනෙකුත් සමාජ ආර්ථික තත්ත්වයන්හි ප්‍රගතිය හේතුකොට ජනගහන වර්ධන අනුපාතිකය අනෙක් සංවර්ධනය වන රටවල් බොහොමයකට වඩා සැලකිය යුතු ලෙස පහළ ගියද, වාර්ෂිකව පුද්ගලයන් 200,000 කට අධික ප්‍රමාණයක් ජනගහනයට එකතු වීම රටෙහි අනෙක් සීමිත සම්පත් මත බරක් වී ඇත. පසුගිය වර්ෂයේ මහ බැංකු වාර්තාවේ දක්වූ පරිදි වත්මන් ජනගහන ව්‍යුහය සහ ප්‍රවණතාවයන් සම්බන්ධව සමාජ ආර්ථික ප්‍රශ්න කිහිපයක් වේ. සේවා වියුක්තිය, ඉඩම් කුඩා කැබලි ලෙස බෙදී යාම, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ නිවාස පහසුකම් සැපයීම වැනි අධික සමාජ සුභසාධන වියදම් සහ ජනගහනය වයස්ගතවීම ආශ්‍රිත ප්‍රශ්න මින් සමහරක් ලෙස තවදුරටත් පවතී. ජනගහනය වයස්ගතවීම සහ වයස්ගත වූවන්ගේ යැපුම් අනුපාතය ඉහළ යාම හේතුකොට වැඩ කරන ජනගහනය මත ඇති වන අධික බර සහ වයස්ගත වූවන්ගේ ජීවන තත්ත්වයේ පහළ යාම වැළැක්වීම පිණිස මැනවින් සැලසුම් කළ ක්‍රමෝපායක් සහ ක්‍රමවත්ව සැකසූ සමාජ ආරක්ෂණ ක්‍රමයක් අවශ්‍ය වෙයි. එසේම මෙය කළයුතු වන්නේ වඩාත් නම්‍ය සහ වෙනස් වන ශ්‍රම වෙළෙඳපළ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි ශ්‍රම වෙළෙඳපොළවල් සැකසීම පිණිස, අනෙකුත් වර්ධනාභිමුඛ ප්‍රතිපත්තිවලට අනුකූලව සැලසුම් කළ ප්‍රතිපත්ති සමූහයක් තුලය.

7.1 සංඛ්‍යා සටහන

**ජනගහනය පිළිබඳ මූලික දත්ත**

| වර්ෂය | ජනගහනය ('000) | වාර්ෂික වර්ධන අනුපාතිකය (%) | දළ උපත් අනුපාතිකය (පුද්ගලයින් දහසකට) | දළ මරණ අනුපාතිකය (පුද්ගලයින් දහසකට) |
|---|---|---|---|---|
| 1871 | 2,417 | 0.8 | 28.5 | 20.0 |
| 1946 | 6,657 | 1.5 | 35.4 | 14.3 |
| 1953 | 8,098 | 2.8 | 48.0 | 10.4 |
| 1963 | 10,582 | 2.7 | 34.1 | 8.5 |
| 1971 | 12,690 | 2.2 | 30.4 | 7.7 |
| 1981 | 14,847 | 1.7 | 28.2 | 5.9 |
| 1991 | 17,247 | 1.5 | 20.6 | 5.5 |
| 1995 | 18,136 | 1.4 | 18.9 | 5.8 |
| 1996 | 18,315 | 1.0 | 18.6 | 6.5 |
| 1997 | 18,552 | 1.3 | 17.9 | 6.1 |
| 1998 (අ) | 18,774 | 1.4 | ල.නො. | ල.නො. |

(අ) තාවකාලික දත්ත

මූලයන් : රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 7.2 ශ්‍රම බලකාය

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් 1990 සිට පවත්වාගෙන යනු ලබන සමීක්ෂණ මාලාවෙහි කාර්තුමය පදනමකින් ශ්‍රම බලකාය පිළිබඳව තොරතුරු අඩංගු වෙයි. මෙම සමීක්ෂණයට අනුව ශ්‍රම බලකාය යනු වයස අවුරුදු 10 ක් හා ඊට වැඩි, ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනයයි. 1998 තෙවැනි කාර්තුව තුළ වූ ශ්‍රම බලකාය දශ ලක්ෂ 6.7 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. 1998 ශ්‍රම බලකාය පිළිබඳ මෙම ඇස්තමේන්තුව පෙර වර්ෂයන්හි ඇස්තමේන්තු සමඟ සෘජුව සැසඳිය නොහැක. ඊට හේතුව වත්මන් සමීක්ෂණයෙහි, මීට පෙර වර්ෂයන්හි ශ්‍රම බලකායට අයත් නොවූ ලෙස සැලකූ, විශේෂයෙන් කෘෂි අංශයේ කුටුම්බ ආදායම් ඉපැයීම් කටයුතුවලට සහාය වූ ගෘහණියන් වැනි ගෙවීමක් නොලබන පවුලේ ආර්ථික කටයුතුවල නියැලුන කාන්තාවන්ද ශ්‍රම බලකායට ඇතුලත් කොට සැලකීමයි. ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය, එනම් ශ්‍රම බලකාය වයස අවුරුදු 10 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස, 1998 තෙවන කාර්තුවේදී සියයට 52 ක් ලෙස ඇස්තමේන්තු කෙරිණ. ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 1990 වර්ෂයේ සිට සියයට 48 - 52 පරාසයක උච්චාවචනය වී ඇත. ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 1997 දී සියයට 49 සිට 1998 දී සියයට 52 දක්වා වැඩි වීමක් පෙන්නුම් කළ අතර ශ්‍රම බලකාය සංයුතියේ ප්‍රගතියක් ලෙසද පිළිබිඹු කෙරුනු මෙම ඉහළ යාමට ස්ත්‍රීන් වැඩියෙන් ශ්‍රම බලකායට ඇතුලත් වීමද මූලික හේතුවක් විය.

7.2 සංඛ්‍යා සටහන

**ශ්‍රම බලකා සහභාගිත්වය**

| වර්ෂය | ශ්‍රම බලකාය 000 | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය, % (අ) සමස්ත | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|---|
| 1990 | 6,001 | 51.9 | 67.7 | 36.2 |
| 1993 | 6,032 | 49.1 | 65.3 | 33.1 |
| 1994 | 6,079 | 48.7 | 65.4 | 32.0 |
| 1995 | 6,106 | 47.9 | 64.4 | 31.7 |
| 1996 | 6,242 | 48.7 | 65.9 | 31.6 |
| 1997 | 6,229 | 48.4 | 65.4 | 31.7 |
| පළමු කාර්තුව | 6,237 | 48.5 | 65.2 | 31.8 |
| දෙවන කාර්තුව | 6,226 | 48.4 | 65.7 | 31.6 |
| තෙවන කාර්තුව | 6,218 | 48.3 | 65.7 | 31.2 |
| හතරවන කාර්තුව | 6,236 | 48.8 | 64.8 | 32.3 |
| 1998 (ආ) | 6,637 | 51.5 | 67.3 | 36.4 |
| පළමු කාර්තුව | 6,647 | 51.6 | 66.6 | 37.6 |
| දෙවන කාර්තුව | 6,574 | 51.0 | 67.7 | 34.8 |
| තෙවන කාර්තුව | 6,693 | 51.9 | 67.5 | 36.7 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) ශ්‍රම බලකාය වයස අවුරුදු 10 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන්
(ආ) පළමු කාර්තු තුනේ සාමාන්‍යය.

## 7.3 සේවා නියුක්තිය

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ශ්‍රම බලකා සමීක්ෂණයන්ට අනුව සේවා නියුක්ත පුද්ගලයකු යනු සමීක්ෂණ තොරතුරු ලබාගන්නා

**7.3 සංඛ්‍යා සටහන**
**නිෂ්පාදන අංශ අනුව සේවා නියුක්තිය**

| ශීර්ෂය | 1995 | 1996 | 1997 | 1997(අ) | 1998(අ) | 1995 | 1997(අ) | 1998(අ) |
|---|---|---|---|---|---|---|---|---|
| | පුද්ගලයින් දහස් | | | | | මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස | | |
| නිෂ්පාදන අංශය | | | | | | | | |
| කෘෂිකර්මය | 1,966.8 | 2,072.2 | 2,069.1 | 1,971.5 | 2,391.6 (ආ) | 36.7 | 35.4 | 38.2 |
| පතල් හා කැනීම් | 89.2 | 86.8 | 77.8 | 80.1 | 79.1 | 1.7 | 1.4 | 1.3 |
| නිමැවුම් කර්මාන්ත | 788.6 | 806.7 | 870.1 | 904.4 | 931.1 | 14.7 | 16.2 | 15.2 |
| විදුලිය, ගෑස් සහ ජලය | 24.9 | 27.5 | 32.3 | 21.6 | 36.5 | 0.5 | 0.4 | 0.7 |
| ඉදිකිරීම් | 285.5 | 297.1 | 301.0 | 298.9 | 304.3 | 5.3 | 5.4 | 4.6 |
| වෙළෙඳාම සහ හෝටල් | 652.8 | 663.6 | 715.8 | 690.3 | 712.0 | 12.2 | 12.4 | 11.7 |
| ගමනාගමනය, ගබඩා සහ සන්නිවේදන හුවමාරු | 252.2 | 270.7 | 269.9 | 294.0 | 279.9 | 4.7 | 5.3 | 4.2 |
| බැංකු සහ රක්ෂණය | 81.3 | 109.7 | 92.0 | 112.5 | 121.7 | 1.5 | 2.0 | 2.0 |
| පෞද්ගලික සේවා සහ අනෙකුත් | 1,215.8 | 1,202.9 | 1,151.3 | 1,197.8 | 1,235.3 (අ) | 22.7 | 21.5 | 22.1 |
| මුළු සේවා නියුක්තිය | 5,357.1 | 5,537.4 | 5,580.0 | 5,571.4 | 6,085.4 (අ) | 100 | 100 | 100 |
| ශ්‍රම බලකායෙන් ප්‍රතිශතය | 87.7 | 88.7 | 89.6 | 89.6 | 90.9 | | | |

(අ) තෙවැනි කාර්තුව

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(ආ) ශ්‍රී ලංකා ශ්‍රම බලකාය සමීක්ෂණයේ සේවා නියුක්ත ශ්‍රම බලකායෙහි ආවරණය ඉහළ දැමීම පිණිස කරන ලද නිර්වචන සංශෝධනය හේතු කොට පසුගිය වර්ෂයන්ගේ දත්ත හා සැසඳිය නොහැක.

දිනට පෙර සතිය තුළ පැයක් හෝ ඊට වැඩි කාලයක් තුළ වේතනයක්, ලාභයක් සඳහා හෝ ගෙවීමක් නොලබා පවුලේ ඉපැයීමක් සඳහා හෝ වැඩ කළ පුද්ගලයෙකි. තමන් නියුතු සාමාන්‍ය ආර්ථික කටයුත්තෙහි තාවකාලිකව නොයෙදුන අයද සේවා නියුක්ත වූවන් ලෙස සැලකේ. සේවා නියුක්තිකයන් පුළුල් වශයෙන් සේවකයන්, සේව්‍යයන්, ස්වං රැකියාවන්හි නියුතු වූවන් සහ ගෙවීමක් නොලබන පවුලේ සේවකයන් ලෙස කොටස් කෙරේ. මෙම සමීක්ෂණයට අනුව, සේවා නියුක්තිය 1990 දී ශ්‍රම බලකායෙන් සියයට 84.1 සිට 1998 තෙවන කාර්තුවේදී සියයට 90.9 දක්වා අඛන්ඩව වර්ධනය විය. ඒ අනුව සේවා වියුක්ති අනුපාතිකය එම කාලය තුළ ශ්‍රම බලකායෙන් සියයට 15.9 සිට සියයට 9.1 දක්වා පහළ බැස ඇත. නිමවුම් කර්මාන්ත, ඉදි කිරීම්, වෙළෙඳාම සහ හෝටල් සේවා, රක්ෂණය සහ දේපල වෙළෙඳාම සහ පෞද්ගලික සේවා යන අංශ නව රැකියා අවස්ථා ඇති කළ මූලික අංශ විය. 1998 වර්ෂය තුළ ආරම්භ කළ නව ව්‍යාපාරික ආයතන 137 ඇතුළුව ආයෝජන මණ්ඩලය යටතේ වූ ව්‍යාපෘති තුලින් නව සෘජු රැකියා අවස්ථා 36,200 ක් පමණ ඇති වූ බව ඇස්තමේන්තු කොට ඇත. නිමැවුම් කර්මාන්ත අංශයේ නව රැකියා 27,000 ක් පමණද, ඉදි කිරීම් අංශයේ නව රැකියා 5,400 ක් පමණද ජනිත වූ බව ඇස්තමේන්තු කොට ඇත. රාජ්‍ය අංශය මගින් සැපයූ නව රැකියා ප්‍රමාණය 19,000 පමණ විය. 1998 රාජ්‍ය අංශයේ වූ මුළු සේවා නියුක්තියෙන් සියයට 9 ක් පමණ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නොවූ තාවකාලික සේවකයෝ වූහ.

කෘෂි අංශයේ සේවා නියුක්තිය 1998 දී වෙනස්වීම පිළිබඳ සංඛ්‍යා දත්ත නොමැති වුවද එම අංශයේ ඇස්තමේන්තුගත දශ ලක්ෂ 2.4 ක් පමණ වූ සේවා නියුක්තිය රටේ මුළු සේවා නියුක්තියෙන් සියයට 38 ක් පමණ නියෝජනය කෙරිණි. මුළු සේවා නියුක්තියෙන් සියයට 15 ට මඳක් වැඩි ප්‍රමාණයක් නිමැවුම් කර්මාන්ත අංශයේද, ඉතිරි සියයට 47 සේවා අංශයේද විය. ලැබී ඇති තොරතුරු අනුව නව රැකියා අවස්ථා උත්පාදනය රට පුරා ව්‍යාප්ත සුළු පරිමාණයේ ව්‍යාපාරික සහ කාර්මික අංශයන්හි විශේෂයෙන් කැපී පෙනුණි.

මුළු සේවා නියුක්තියෙහි රාජ්‍ය අංශයේ කොටස (රජයේ සහ අර්ධ රාජ්‍ය ආයතන) 1998 දී තවදුරටත් පහත වැටුණි. 1993 දී මුළු සේවා නියුක්තියෙන් සියයට 25 ක් පමණ වූ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 1998 දී සියයට 18 ට ආසන්න ප්‍රමාණයකට අඩු විය. පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව රාජ්‍ය අංශයේ ව්‍යාපාරික ආයතන ප්‍රතිසංස්කරණය සහ පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරිත්වය ප්‍රසාරණය හේතුකොටගෙන අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය කැපී පෙනෙන ලෙස පහත වැටුනි. නව රැකියා අවස්ථාවන්ගෙන් බහුතරය පෞද්ගලික අංශයේ දක්නට ලැබුනි. මෙම ප්‍රවණතාවය ජනලේඛන හා සංඛ්‍යා

7.4 සංඛ්‍යා සටහන
ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

(පුද්ගලයින් දහස්)

| | 1993 | 1994 | 1995 | 1996 | 1997 | 1998(අ)(ආ) |
|---|---|---|---|---|---|---|
| මුළු ජනගහනය | 17,619 | 17,865 | 18,136 | 18,315 | 18,552 | 18,774 |
| කුටුම්බ ජනගහනය | 12,278 | 12,493 | 2,736 | 12,831 | 12,864 | 12,896 |
| (වයස අවු. 10 සහ ඊට වැඩි) | | | | | | |
| ශ්‍රම බලකාය | 6,032 | 6,079 | 6,106 | 6,242 | 6,229 | 6,693 |
| සේවා නියුක්තිය | 5,201 | 5,281 | 5,357 | 5,537 | 5,580 | 6,085 |
| රාජ්‍ය අංශය | 1,295 | 1,325 | 1,307 | 1,161 | 1,080 | 1,091 |
| මධ්‍යම රජය | 676 | 700 | 738 | 752 | 762 | 790 |
| අර්ධ රාජ්‍ය අංශය | 619 | 625 | 569 | 409 | 310 | 301 |
| පෞද්ගලික අංශය | 3,906 | 3,956 | 4,050 | 4,376 | 4,500 | 4,994 |
| ආයෝජන මණ්ඩලය යටතේවූ ආයතන | 180 | 206 | 233 | 242 | 258 | 294 |
| අනෙකුත් | 3,726 | 3,750 | 3,817 | 4,134 | 4,242 | 4,700 |
| සේවා වියුක්තිය | 830 | 798 | 749 | 705 | 649 | 607 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය % | 49.1 | 48.7 | 47.9 | 48.6 | 48.4 | 51.9 |
| සේවා වියුක්ති අනුපාතිකය % | 13.8 | 13.1 | 12.3 | 11.3 | 10.4 | 9.1 |
| ගෙවීමක් නොලද පවුලේ සේවකයන් ඉවත් කොට ඇස්තමේන්තු කල සේවා වියුක්ති අනුපාතිකය, % | 15.3 | 14.3 | 13.4 | 12.4 | 11.4 | 10.3 |

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තෙවන කාර්තුව
(ආ) 1998 වර්ෂයේදී ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය අධිකව ඉහල යාමට හේතුව කෘෂි අංශයේ ගෙවීමක් නොලබන පවුලේ ස්ත්‍රී සේවකයන්ගේ ආවරණය ඉහල දැමීමයි. එම නිසා 1998 වර්ෂයේ මුළු ශ්‍රම බලකාය සහ පෞද්ගලික අංශයේ "අනෙකුත්" කාණ්ඩයේ සේවා නියුක්ති දත්ත අනෙක් වර්ෂ සමග සැසඳිය නොහැක.

ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත වලින් මෙන්ම මහ බැංකුවේ දත්ත වලින්ද පෙන්නුම් කරයි. 1998 රාජ්‍ය අංශයේ දශ ලක්ෂ 1.09 ක් ලෙස ඇස්තමේන්තුගත සේවා නියුක්තිය 1997 හා සැසඳීමේදී සියයට 1.8 ක පමණ ආන්තික වර්ධනයක් වාර්තා කෙරිණ. මධ්‍යම රජය සහ පලාත් පාලන රාජ්‍ය ආයතන ඇතුලත් රජයේ ආයතනයන්හි සේවා නියුක්තිය පසුගිය වර්ෂ දෙකට වඩා වැඩි වර්ධන අනුපාතිකයක් වූ සියයට 3.7 කින් ඉහළ නැඟුණි. අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි පසුගිය වර්ෂ තුනක කාලය තුල සිදු වූ සැලකිය යුතු අඩු වීම සැසඳීමේදී සියයට 2.9 ක පමණ සුළු අඩු වීමක් වාර්තා විය.

## 7.4 සේවා වියුක්තිය

පසුගිය වර්ෂවල සේවා වියුක්තිය නොකඩවා පහත බැසීම, රටෙහි සීඝ්‍ර ආර්ථික වර්ධනය සහ එමගින් සිදුවූ රැකියා අවස්ථා වර්ධනය පිළිබිඹු කරන්නකි. රැකියාවක් කිරීමට සූදානම් හෝ රැකියාවක් සොයන එහෙත් යෙදීමට රැකියාවක් නොමැති පුද්ගලයන් සේවා වියුක්ත පුද්ගලයන් ලෙස සැලකේ. සේවා වියුක්ති අනුපාතිකය (සේවා වියුක්ති පුද්ගලයන් ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් වශයෙන්) 1990 දී සියයට 15.9 සිට 1998 තෙවන කාර්තුවේදී සියයට 9.1 දක්වා ප්‍රතිශතක ඒකක 6.8 ක පහත වැටීමක් පෙන්වීය. ශ්‍රම බලකාය තුල සේවා නියුක්ති පුද්ගලයන් ලෙස ගෙවීමක් නොලද පවුලේ සේවකයන්ගේ ආවරණය ඉහළ දැමීම නිසාද 1998 සේවා වියුක්ති අනුපාතිකය යම්දුරට අඩු වීමේ නැඹුරුවක් ඇති විය. ගෙවීමක් නොලද පවුලේ සේවකයන් ශ්‍රම බලකායෙන් ඉවත් කොට ලබා ගත් සංශෝධිත දත්ත අනුව සේවා වියුක්ති අනුපාතිකය 1997 දී සියයට 11.4 ක් ද, 1998 තෙවන කාර්තුවේදී සියයට 10.3 ක් ද ලෙස ඇස්තමේන්තු කෙරිණ. ඒ අනුව සැලකුවිට 1998 දී සේවා වියුක්ති අනුපාතිකය අඩු තරමින් එක් ප්‍රතිශතක ඒකකයකින් පමණ පැහැදිලි ලෙස පහත බැස ඇත.

සමීක්ෂණයට අනුව ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය මෙන් දෙගුණයක් පමණ වුවද රටෙහි සේවා වියුක්තිය පහත වැටීම ස්ත්‍රී පුරුෂ යන දෙපක්ෂයේම සේවා වියුක්තිය පහත වැටීම තුලින් සිදු විය. පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය 1990 දී සියයට 11.8 සිට 1998 තෙවන කාර්තුවේදී සියයට 7.1 දක්වා පහත වැටුන අතර ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය මෙම කාල පරිච්ඡේදය තුල සියයට 23.4 සිට සියයට 12.7 දක්වා පහත වැටුණි. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ සේවා වියුක්ති පරතරය 1990 දී පැවැති ප්‍රතිශතක ඒකක 12 සිට 1998 දී ප්‍රතිශතක ඒකක 6 දක්වා පහත හෙලමින් ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය වැඩි වේගයකින් පහත බැස ඇත.

**7.5 සංඛ්‍යා සටහන**

**සේවා කාණ්ඩ අනුව සේවා නියුක්තිය** ප්‍රතිශතය

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයින් | පෞද්ගලික අංශයේ සේවකයින් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1990 | 21.5 | 33.7 | 1.8 | 29.2 | 13.8 | 100 |
| 1991 | 22.9 | 39.5 | 2.2 | 25.4 | 10.0 | 100 |
| 1992 | 20.0 | 40.0 | 1.6 | 27.1 | 11.2 | 100 |
| 1993 | 17.4 | 42.8 | 2.0 | 27.4 | 10.4 | 100 |
| 1994 | 16.4 | 44.3 | 2.3 | 27.2 | 9.8 | 100 |
| 1995 | 15.6 | 44.3 | 2.5 | 28.3 | 9.4 | 100 |
| 1996 | 15.0 | 45.8 | 2.3 | 26.8 | 10.0 | 100 |
| 1997 | 15.2 | 44.0 | 2.4 | 29.1 | 9.4 | 100 |
| පළමු කාර්තුව | 15.0 | 44.7 | 1.7 | 29.0 | 9.7 | 100 |
| දෙවන කාර්තුව | 15.6 | 44.2 | 2.4 | 27.5 | 10.2 | 100 |
| තෙවන කාර්තුව | 16.5 | 42.9 | 2.7 | 28.8 | 9.1 | 100 |
| හතරවන කාර්තුව | 13.7 | 44.3 | 2.7 | 31.2 | 8.2 | 100 |
| 1998(අ) | 13.8 | 41.7 | 2.0 | 28.8 | 13.5 | 100 |
| පළමු කාර්තුව | 13.1 | 41.8 | 1.7 | 28.8 | 14.7 | 100 |
| දෙවන කාර්තුව | 14.4 | 41.6 | 2.3 | 28.7 | 12.9 | 100 |

(අ) මුල් කාර්තු දෙකේ සාමාන්‍යය.

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**7.6 සංඛ්‍යා සටහන**

**සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| වර්ෂය | පුරුෂ | ස්ත්‍රී | සමස්ත |
|---|---|---|---|
| 1990 | 11.8 | 23.4 | 15.9 |
| 1991 | 10.2 | 23.0 | 14.7 |
| 1992 | 10.7 | 22.9 | 14.6 |
| 1993 | 9.7 | 21.7 | 13.8 |
| 1994 | 9.7 | 20.1 | 13.1 |
| 1995 | 8.8 | 18.8 | 12.3 |
| 1996 | 8.5 | 18.0 | 11.3 |
| 1997 | 7.6 | 16.2 | 10.4 |
| පළමු කාර්තුව | 8.0 | 16.2 | 10.7 |
| දෙවන කාර්තුව | 7.2 | 16.3 | 10.2 |
| තෙවන කාර්තුව | 7.4 | 16.7 | 10.4 |
| හතරවන කර්තුව | 7.7 | 15.5 | 10.3 |
| 1998 (අ) | 6.9 | 14.6 | 9.7 |
| පළමු කාර්තුව | 7.1 | 16.2 | 10.6 |
| දෙවන කාර්තුව | 6.6 | 14.9 | 9.5 |
| තෙවන කාර්තුව | 7.1 | 12.7 | 9.1 |

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මුල් කාර්තු තුනේ සාමාන්‍යය.

සේවා වියුක්තියෙහි මෑතකාලීන උපනතීන්හි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ විධිමත් උසස් අධ්‍යාපනික සුදුසුකම් ඇති පුද්ගලයන් අතර සේවා වියුක්තිය නොකඩවා ඉහළ මට්ටමක පැවතීමයි. පසුගිය කාලයේ සියළු අධ්‍යාපනික මට්ටම්හි සේවා වියුක්ති අනුපාතිකයන් පහළ වැටුනද, අ.පො.ස. (උ.පෙළ) සහ ඊට ඉහළ සුදුසුකම් සහිත පුද්ගලයන්ගේ සේවා වියුක්ති අනුපාතිකය රටේ සමස්ත සේවා වියුක්ති අනුපාතිකය හා සැසඳීමේදී සැලකිය යුතු ඉහළ මට්ටමක පැවතිණ. අ.පො.ස. (උ.පෙළ) සහ ඊට ඉහළ සුදුසුකම් ඇති සේවා වියුක්ති පුද්ගලයන් 1990 දී මුළු සේවා වියුක්ති පුද්ගලයන්ගෙන් සියයට 15 සිට 1998 දී සියයට 21 දක්වා ඉහළ ගිය අතර එම සුදුසුකම් සහිත පුද්ගලයන් ශ්‍රම බලකායෙහි අනුපාතිකයක් වශයෙන් වැඩි වූයේ සියයට 8 සිට සියයට 13 දක්වා පමණි. මීට සමාන ප්‍රවණතාවයක් ශ්‍රම බලකායෙහි අ.පො.ස. (සා.පෙළ) සහ ඊට ඉහළ සුදුසුකම් සහිත පුද්ගලයන් සැලකීමේදී ද දක්නට ලැබුනද වෙනස්වීම තරමක් අඩු මට්ටමක විය. මෙම තත්ත්වය තුළින් අධ්‍යාපනික පුහුණුව සහ රැකියා අවස්ථා අතර නොගැලපීමක් පෙන්නුම් කරයි.

මෙම තත්ත්වයට වත්මන් අධ්‍යාපන ක්‍රමය බොහෝ දුරට හේතු වී ඇති බව පෙනේ. වත්මන් අධ්‍යාපන ක්‍රමය සම්ප්‍රදායික විෂයයන් පිළිබඳව ශිෂ්‍යයන්ගේ විෂය දැනීම පරීක්ෂා කිරීම මත පදනම් වී ඇති අතර ඔවුන්ට තරඟකාරී සහ නවීකරණය වන වෘත්තීමය පරිසරයක සාර්ථකව කටයුතු කිරීමට අවශ්‍ය හැකියාව එම විෂයයන් මගින් නොලැබේ. එසේම, නැගී එන පෞද්ගලික අංශයේ ශ්‍රම වෙළෙඳපොළෙහි ගණකාධිකරණය , මූල්‍ය, කළමනාකරණය, අලෙවිකරණය, පරිගණක වැඩසටහන් භාවිතය සහ ඉංග්‍රීසි භාෂාව වැනි වෘත්තීය සහ තාක්ෂණික අංශයන්හි සුදුසුකම් ලත් පුද්ගලයන් සඳහා වැඩි ඉල්ලුමක් පවතී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශිෂ්‍යයන් අතර ඔවුන්ගේ ප්‍රමාණවත් නොවූ සම්ප්‍රදායික අධ්‍යාපනික පුහුණුව මගින් ඉටු කර ගත නොහැකි බලාපොරොත්තු ඇති කරවීමට මෙම ක්‍රමය තුඩු දෙයි. මෙවැනි සිසුහු බොහෝවිට පාසැල් අධ්‍යාපනයෙන් පසු උසස් යයි පිළිගත් කාර්යාල රැකියා බලාපොරොත්තුවෙන්

පසු වෙති. එමනිසා වත්මන් අධ්‍යාපන ක්‍රමය යටතේ ලබා ගන්නා විධිමත් අධ්‍යාපන සුදුසුකම් ඉහළයත්ම, එම සුදුසුකම් සඳහා යෝග්‍ය යයි අපේක්ෂිත රැකියාවක් ලබා ගැනීමේ අවස්ථා අඩු වේ. උග්‍ර ප්‍රශ්නයක් වශයෙන් සැලකෙන රටෙහි ඉහළ අධ්‍යාපනයක් ලැබූවන්ගේ සේවා වියුක්ති ප්‍රශ්නයේ ඉතාමත් සරල විග්‍රහය මෙයයි. ශ්‍රම වෙළඳපොලෙහි පහසුවෙන් සේවා නියුක්ත කළ හැකි පුද්ගලයන් බිහිකිරීමට අධ්‍යාපන ක්‍රමයට හැකිවන පරිදි මෙම ප්‍රශ්ණය සහ වෙනත් ගැටලු විසදීම අරමුණු කොට වත්මන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කෙරේ.

ශ්‍රම බලකාය සමීක්ෂණයේ අලුත්ම ඇස්තමේන්තු මගින් පලාත් අතර සේවා වියුක්ති අනුපාතිකයේ පවතින වෙනස්කම්

**7.7 සංඛ්‍යා සටහන**

**අධ්‍යාපනික මට්ටම අනුව සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| වර්ෂය | පාසැල් අධ්‍යාපනයක් නොමැති | 0-4 ශ්‍රේණිය 1-5 වසර | 5-9 ශ්‍රේණිය 6-10 වසර | අ.පො.ස.(සා.පෙ.) ජා.පො.අ.ස. | අ.පො.ස.(උ.පෙ.) උ.ජා.අ.ස. | සමස්ත |
|---|---|---|---|---|---|---|
| 1990 | 3.4 | 5.2 | 17.2 | 23.8 | 29.4 | 15.9 |
| 1991 | 4.0 | 4.9 | 14.9 | 25.0 | 24.7 | 14.7 |
| 1992 | 3.5 | 5.4 | 16.1 | 21.8 | 20.7 | 14.6 |
| 1993 | 3.0 | 4.9 | 13.7 | 21.3 | 23.2 | 13.8 |
| 1994 | 2.6 | 5.0 | 13.0 | 19.6 | 23.8 | 13.1 |
| 1995 | 1.9 | 3.0 | 12.8 | 18.4 | 19.9 | 12.3 |
| 1996 | 2.7 | 3.4 | 12.2 | 16.4 | 18.9 | 11.3 |
| 1997 | 1.3 | 2.3 | 10.8 | 15.7 | 19.0 | 10.4 |
| පළමු කාර්තුව | 2.4 | 1.5 | 11.1 | 15.6 | 21.2 | 10.7 |
| දෙවන කාර්තුව | 0.2 | 2.2 | 11.0 | 16.1 | 18.9 | 10.2 |
| තෙවන කාර්තුව | 0.5 | 3.1 | 10.2 | 14.6 | 19.3 | 10.4 |
| හතරවන කාර්තුව | 2.2 | 2.6 | 10.8 | 16.7 | 16.7 | 10.3 |
| 1998(අ) | 0.2 | 2.6 | 10.2 | 13.5 | 16.2 | 9.7 |
| පළමු කාර්තුව | 0.1 | 2.9 | 12.0 | 15.8 | 14.9 | 10.6 |
| දෙවන කාර්තුව | 0.5 | 1.9 | 9.1 | 14.4 | 18.9 | 9.5 |
| තෙවන කාර්තුව | 0.0 | 3.0 | 9.4 | 10.3 | 14.8 | 9.1 |

(අ) පළමු කාර්තු තුනේ සාමාන්‍යය.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පෙන්වයි. පහලම මට්ටමේ සේවා වියුක්ති අනුපාතිකය (සියයට 6.7) උතුරු මැද පලාතේ වූ අතර, ඉහළම සේවා වියුක්ති අනුපාතිකය (සියයට 13.6) දකුණු පලාතේ දක්නට ලැබිණ.

## 7.5 විදේශ සේවා නියුක්තිය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව වාර්තාගත මූලයන් මගින් පුද්ගලයන් විදේශ රැකියා සඳහා විගමනය වීම 1995 වර්ෂය තෙක් වාර්තා වූ ඉහළම සංඛ්‍යාව වන පුද්ගලයන් 172,000 දක්වා ක්‍රමිකව වැඩි වී ඇත. 1996 සහ 1997 වර්ෂයන්හි විදේශ රැකියා සඳහා පිටත් වූ සංඛ්‍යාවේ අඩු වීමක් වූ අතර, එය 1998 දී සියයට 7 ක පමණ වර්ධනයක් පෙන්වමින් පුද්ගලයන් 158,000 ක් පමණ වූ බව ඇස්තමේන්තු කොට ඇත. විදේශ රැකියා සඳහා පුද්ගලයන් නියමිත පරිදි ලියාපදිංචි මූලයන් මගින් යාම තහවුරු කර ගැනීම පිණිස විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් තම සුපරීක්ෂාකාරීත්වය ගුවන් තොටුපලෙහි පරීක්ෂණ තුලින් දැඩි කෙරිණ. මෙම වර්ෂය තුලද රජය විසින් පූර්ව සේවා පුහුණුව සහ සුභසාධන සේවාවන් විදේශගත ශ්‍රී ලාංකික සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වලට සපයනු ලැබීය. 1998 වර්ෂයේදී මැද පෙරදිග රටවල සහ සිංගප්පූරුවේ රැකියාවන්හි නියුතු ශ්‍රී ලාංකිකයන්ට උපකාර කිරීම පිණිස සුභසාධන නිලධාරීන් 12 දෙනෙක් පත් කොට යැවිණ. එසේම කාර්යාංශය මගින් විදේශගතවන සේවකයන් සහ ඔවුන්ගේ පවුල් සඳහා උපකාරක පහසුකම් රාශියක් හඳුන්වාදී ඇත. විදේශ රැකියා සඳහා යාමට අපේක්ෂිත පුද්ගලයන් සඳහා පුහුණු පහසුකම්, කාර්යාංශයෙහි ලියාපදිංචි පුද්ගලයන් සඳහා රක්ෂණයක් ලබාදීම, ගිවිසුම් ගත කාලය නිමවීමට පෙර පැමිණීමට සිදුවන අය සඳහා ගුවන් වියදම් සැපයීම, ළමයින් සඳහා ශිෂ්‍යත්ව වැඩ පිළිවෙල සහ මහජන බැංකුව සමග ක්‍රියාත්මක කරන අඩු පොලී නිවාස ණය ක්‍රමය මින් සමහරකි.

**7.8 සංඛ්‍යා සටහන**

**පලාත් අනුව සේවා වියුක්ති අනුපාතිකය 1997**
**(ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| පලාත | පුරුෂ | ස්ත්‍රී | සමස්ත |
|---|---|---|---|
| බස්නාහිර | 9.0 | 14.5 | 10.7 |
| මධ්‍යම | 8.8 | 18.5 | 12.3 |
| දකුණ | 9.1 | 22.3 | 13.6 |
| වයඹ | 6.2 | 13.6 | 8.5 |
| උතුරු මැද | 4.5 | 11.8 | 6.7 |
| ඌව | 5.4 | 11.5 | 7.8 |
| සබරගමුව | 6.2 | 18.0 | 10.0 |
| සමස්ත | 7.7 | 16.1 | 10.5 |

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව